# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)
# (කර්මාන්ත අමාත්‍යාංශය)

# ඇබෑර්තු

කාර්මික සංවර්ධන මණ්ඩලය යනු, ශ්‍රී ලංකාවේ කර්මාන්ත ධෛර්යමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීමේ වගකීම පවරා ඇති, 1969 අංක 36 දරන පනතින් ස්ථාපිත කළ, ප්‍රමුඛතම රාජ්‍ය අංශයේ සංවිධානය වේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## 01. අභ්‍යන්තර විගණක තනතුර - (MM 1-2) (තනතුරු 01)

**රැකියා විස්තරය :**

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කාර්ය අධීක්ෂණයේ සමස්ථ වගකීම දරන අතර, විගනණ කටයුතු සිදු කරමින්, මණ්ඩලය තුළ සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගැනීම උදෙසා ස්වාධීනව විමර්ෂණ සිදුකිරීම හා FR 133 හා 134 යටතේ අදාළ නිරීක්ෂණ, නිර්දේශ සමග මණ්ඩලයේ සභාපති වෙත වාර්තා කිරීම, වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම හා ක්‍රියාමාර්ග සැලැස්ම සකස් කිරීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම, අදාළ අනුමත කළ සැලැස්ම ප්‍රකාරව විගණන හා විමර්ෂණ පැවැත්වීම, ස්ථාපිත ප්‍රතිපත්ති හා ක්‍රියාපිළිවෙත් සම්බන්ධව අනුකූලත්වය දැක්විය යුතු අතර, මණ්ඩලයේ විගණන වැඩසටහන සමාලෝචනය කිරීම හා පවත්නා පාලන පද්ධති වැඩිදියුණු කොට උත්ශ්‍රේණි ගත කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් (පහත 1 හෝ 2)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරන/ මූල්‍ය/ වාණිජ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හෝ උසස් ජාතික ගණකාධිකරණ (HNDA) ඩිප්ලෝමාව සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

හෝ

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL)/ එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA)/ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරී සංගමයේ (ACCA) අන්තර්මධ්‍ය සුදුසුකම් සමග අවම වසර 03 ක, අදාළ ක්ෂේත්‍රයේ අවම වසර 03 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

## 02. සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර - (MM 1-2) - (තනතුරු 01)

**රැකියා විස්තරය**

මණ්ඩලයේ නීති කටයුතු සඳහා පරිපාලන අධ්‍යක්ෂ වෙත සහායවීම. (ගිවිසුම්, බැඳුම්කර, කම්කරු ගැටළු හා අනෙකුත් විනය සම්බන්ධව කරුණු, කම්කරු උසාවි කටයුතු සඳහා හා අනෙකුත් නීති විනිසුම්හල්වලදී මණ්ඩලය නියෝජනය කිරීම සිදුකළ යුතුවේ.)

අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් (පහත 1 හෝ 2)

01. විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් LLB නීති උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ, සුදුසුකම් ලැබීමෙන් පසු, නීතිඥවරයකු ලෙස අවම වසර 02 ක පළපුරුද්ද

හෝ

නීතිඥවරයකු වීම සහ අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද.

**වයස් සීමාව** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : MM 1-2 : රුපියල් 54,550 - 1,375X10-1,910X15-96,950/-

**පහසුකම් හා ප්‍රතිලාභ :**

- ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම
- සේවකයා හා පවුලේ අය ආවරණය වන පරිදි වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය
- වාර්ෂික ප්‍රසාද දීමනා
- සහනදායී පොලී අනුපාතයට ආපදා ණය.
- අග්‍රහාර රක්ෂණ යෝජනාක්‍රමය

**පොදු කොන්දේසි :**

01. මෙම තනතුර, කාර්ය මණ්ඩලය අතරෙහි ස්ථිර පත්වීමක් වේ.

02. තනතුරට තෝරාගත් අයදුම්කරු, සේවක අර්ථසාධක අරමුදලට (EPF) තම වැටුපෙන් 10% කින් දායක විය යුතු අතර, මණ්ඩලය විසින් ඒ සඳහා 12% ක දායකත්වයක් දරනු ලබයි. එයට අමතරව, සේවක භාර අරමුදලටද (ETF) මණ්ඩලය විසින් 3% ක දායකත්වයක් දරනු ඇත.

03. අයදුම්පත්, උප්පැන්න, අධ්‍යාපනික, වෘත්තීය හා පළපුරුද්ද සම්බන්ධ සහතිකවල පිටපත් සමග ජීවදත්ත ඇතුළත්ව, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර සමග, ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත, 2022-04-01 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අයදුම් කරනු ලබන තනතුර අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

04. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම තමන්ගේ අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් තම අයදුම්පත් යොමු කළ යුතුය.

05. ඉහතින් සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවන ලෙස ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

06. මේ සම්බන්ධව යම් බලපෑම් සිදුකිරීම, නුසුදුසුභාවයට පත්කිරීමට හේතුවනු ඇත.

**සභාපති,**
**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය,**
**615, ගාලු පාර, කටුබැද්ද,**
**මොරටුව.**